අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
සිංහල භාෂා ඒකකය

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරඟාවලිය - 2023**
**(කලාප මට්ටම)**

1. අපේක්ෂකයාගේ නම : ......................................................................................
   ( මුලකුරු සමඟ නිවැරදිව ලියන්න. )
2. විදුහලේ නම සහ ලිපිනය : ........................................................................
3. පාසල් වර්ගය : 200ට අඩු/ 201-500 තෙක්/ 500ට වැඩි
4. කලාපය : ..............................................................
5. පළාත : ..................................................................

---

**ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන**

**6 ශ්‍රේණිය** **කාලය : පැය 02 යි**

I කොටසින් එකක් ද, II කොටසේ (අ) යටතේ එකක් ද, (ආ) යටතේ එකක් ද, (ඉ) යටතේ එකක් ද වශයෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

**I කොටස**

1. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150කට නොඅඩු රචනයක් ලියන්න.
   (අ) අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ
   (ආ) පොල් ගස අපට කප් රුකකි
   (ඇ) වන සම්පත සුරකිමු
   (ඈ) මා කියවූ හොඳම පොත
   (ඉ) උදෑසන අසිරිය ( ලකුණු 40යි )

**II කොටස**

(අ) (i) එළඹෙන පාසල් නිවාඩුවේ දී ඔබ පවුලේ සාමාජිකයින් සමග කොළඹ ග්‍රහලෝකාගාරය හා දෙහිවල සත්තු වත්ත නැරඹීම සඳහා යාමට අදහස් කර ඇත. එම ගමනට ඔබ හා එක්වන ලෙස දන්වමින් දුර බැහැර සිටින ඔබේ මිතුරෙකුට / මිතුරියකට **ලිපියක්** ලියන්න.

(ii) ප්‍රදේශයේ මහජන පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීමට සිතන ඔබ ඒ සඳහා අවශ්‍ය **ඉල්ලුම් පත්‍රය** සකස් කරන්න.

( ලකුණු 20යි )

(ආ) (i) මෙවර වෙසක් පොහෝ දින ඔසු පැන් දන්සලක් පැවැත්වීමට ඔබ පාසලේ බෞද්ධ සමිතිය සූදානම් වේ. මේ පිළිබඳව දෙමව්පියන් හා ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම සඳහා සුදුසු **දැන්වීම් පත්‍රිකාවක්** පිළියෙළ කරන්න. ( වචන 100කට නොවැඩි විය යුතු ය.)

(ii) ඔබ පාසලේ ආදි ශිෂ්‍ය සංගමය විසින් ඉදිකරන ලද පුස්තකාලය සිසු අයිතියට පත් කිරීමේ උත්සවය පසුගිය දා සිදුවිය. එම සංගමයේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ එම උත්සවය පිළිබඳ විස්තර කරමින් **පුවත්පත් වාර්තාවක්** සකස් කරන්න. (වචන 100කට නොවැඩි විය යුතු ය.)

( ලකුණු 20 යි )

(ඉ) (i) ඔබගේ සිංහල විෂයභාර ගුරුතුමියගේ / ගුරුතුමාගේ උපන්දිනයට යැවීමට **සුබ පැතුම් පතක්** සකස් කරන්න.

(ii) ඩෙංගු උවදුරෙන් ඔබ ගමේ කිහිප දෙනකු මරණයට පත් වී ඇත. පරිසරයේ අපවිත්‍රතාව ඊට බෙහෙවින් හේතු වී ඇත. මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා **පෝස්ටරයක්** සකස් කරන්න.

( ලකුණු 20 යි )